(4)
00224

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2019**

**ESD1134/EPD3234-** විෂයමාලා අධ්‍යයනය හා ප්‍රායෝගික වැඩ සෞඛ්‍ය,පෝෂණය හා ආරක්ෂාව පිළිබඳ ගතයුතු පියවර

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2019.03.03 වේලාව - පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පමණක් පිළිතුරු සපයන්න.

## 1 - වන කොටස

01. නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා සටහන යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

02. ප්‍රථමාධාරකරුවෙකු යනු කවරෙකුදැයි පැහැදිලි කරන්න.

03. ළමා සෞඛ්‍ය වර්ධන සටහන නැමැති උපකරණය භාවිතා කිරීමේ අරමුණ විස්තර කරන්න.

04. "උපතේ සිට වයස මාස 06 ක් දක්වා පමණ කාලය තුළදී ළදරුවෙකුට මවුකිරි වඩාත්ම යෝග්‍යතම ආහාරයයි."

    හේතු තුනක් (03) මගින් ඉහත ප්‍රකාශය තහවුරු කරන්න.

05. ජීවිතයේ පළමු වසර තුළදී ළදරුවෙකුට ඛනිජ ලවණ අත්‍යාවශ්‍යය ඇයිදැයි උදාහරණ මගින් පැහැදිලි කරන්න.

06. කම්මුල්ගාය නම් රෝගයේ රෝග ලක්ෂණ හතරක් (04) දක්වන්න.

07. ළදරුවෙකුට අමතර ආහාර හඳුන්වාදීමට සුදුසු වයස හේතු දෙකක් **(02)**මගින් පැහැදිලි කරන්න.

08. ළමා අපයෝජන වැළැක්වීමට ප්‍රාථමික පාසල් ගුරුවරුන්ට ගත හැකි පියවර හතරක් (04) දක්වන්න.

( 5 x 8 = ලකුණු 40)

## 2 වන කොටස

09. (i) 'ප්‍රතිශක්තිය' යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) සක්‍රීය ප්‍රතිශක්තිය සහ එහි වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) කාන්තාවන්ට වයස අවුරුදු 15 – 44 කාලයේදී යම් විශේෂිත රෝගයකින් ආරක්ෂා වීම සඳහා ලබාදිය යුතු එන්නත නම් කර එම රෝගයේ රෝග ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. (i) 'ප්‍රෝටීන ශක්ති මන්දපෝෂණය' යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) වයස අවුරුදු 0-5 වයස් සීමාවේ පසුවන ළමුන් අතුරින් ප්‍රෝටීන ශක්ති මන්දපෝෂණයෙන් පෙළෙන ළමුන් හඳුනාගත හැකි ලක්ෂණ තුනක් (03) දක්වන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කළ ඌනතා සංකූලතාවය සඳහා හේතුවන සාධක හතරක් (04) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. (i) කුඩා දරුවන් තුළ නිසි වර්ධනයක් ලබා ගැනීමට අසමත්වීම සඳහා හේතුවන කරුණු තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ඉහත තත්ත්වය අවම කිරීමට දෙමාපියන්ට ගත හැකි පියවර තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) දරුවෙකුගේ මානසික යහපැවැත්ම වර්ධනය කරන සාධක හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) දෙමාපියන්ගේ/රැකබලාගන්නන්ගේ නොසැලකිලිමත් බව නිසා කුඩා දරුවන් බහුලව ලක්වන ගෘහ අනතුරු හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

(ii) ගෘහ අනතුරු අවම කිරීම සඳහා දෙමාපියන්ට/රැකබලාගන්නන්ට අනුගමනය කළ හැකි පියවර තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 09)

(iii) ප්‍රාථමික පාසලක් තුළ නිසි සනීපාරක්ෂක ක්‍රමවේදයන් ක්‍රියාත්මක විය යුත්තේ ඇයිදැයි උදාහරණ තුනක් **(03)** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

13. (i) ගර්භණී මවක් තම පෝෂණය පිළිබඳව සැලකිලිමත් විය යුත්තේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ගර්භණී සමය තුළ ඇති විය හැකි දුර්වල පෝෂණ තත්ත්වයන්ට හේතුවන සාධක තුනක් **(03)** සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) ගර්භණී මවකට නිසි පෝෂණයක් ලබා දීම සඳහා පවුලේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.